




# ඔබ මෙහි ආවේ තනිවම නොවෙයි.

ඇමරිකානු ජාතික කල කාන්තාවක් පසුගිය දවසක ඇය බලාපොරොත්තු වුන ජිවිතයේ ඉහලම ඉලක්කය ලගාකරගත් පසු අපූරු කථාවක් කලා. එහිදි ඇය සඳහන් කලා මගේ ජිවතය පිරිච්ච එකක් ඒ සියලු අපහසුතා ජයගෙන මගේ ජිවිතය සාර්ථක කරගන්න මට ලැබුනේ මගේ පියාගේ අවවාද හා මගපෙන්වීම නිසයි. මගේ පියා මට නිතරම කිව්වේ ඔබ ඇමරිකාවේ ඉපදුන කලු ජාතික කන්තාවක්. ඔබ සුදු ඇමරිකානුවන් වගේ දෙගුණයක් දක්ෂ වුනොත් පමනයි ඔබට ඔවුන් ලගාකරන්න දේවලින් භාගයක් ලබාගත හැකි වන්නේ. ()

මව මගේ ක්ෂේත්‍රයේ ඉන්නේ කාටවත් නොදිව්නි තැනක. මම තාමත් ඇලුත් දේවල් ඉගෙන ගනිමින් දැනුවත් වෙනවා. මම එන ගමන් දියුණුවට උපදෙස් දෙන කෙනෙක් ගේ අවවාදයක් අහනන් විතරයි. මගේ විවේචන වලටත් මාව අධෛර්යමත් කරන කතා අහන්නවත් මම නතර වුනේ නෑ"

ලංකා ඉතිහාසයේ මෙතෙක් වාරතාවුන දරුණුතම ස්වභාවික අනතුර ලෙස සටහන් වෙන්නේ 2004 සිදු වූ සුනාමි විනාශය. එහි දී ජිවිත විශාල ගණනක් අහිමි වුනා. විශාල පිරිසකට උන්හිටි තැන නැතිවුනා. අනතුරට සෘජුවම මුහුණ දුන් නොදුන් හැමදෙනාම මහා කම්පනයකට පත්වුනා. සමහරු අහන් පටන්ගත්තා "ඇයි අපිට මෙහෙම වුනේ මොකක්ද අපි කරපු වැරැද්ද හො"පාප කර්මය" කියයා. ඒ අතරතුරු තව පිරිසක් 'කිව්වා' අපි හරි අවාසනාවන්තයි. ඇයි අපිටම මෙහෙම කරදර වෙන්නේ කියලා. තවත් කොටසක් ඇහුවා " අපි කොහොමද නැවතත් නැගිටින්නේ ඒ වෙනුවෙන් අපිට මොනවාද කරන්න තියෙන්නේ. " කියලා . අහපු ප්‍රශ්ණය අනුව ඒඑ" අයට ගැලපෙන පිලිතුරක් ලැබෙන්න ඇති.

අපිට මුහුන දීමට සිදුවන අභියෝග එකිනෙකට වෙනස්. ඒ අභියෝගය ඉදිරියට යාමට මිසක් ඒ නිසා සිදුවන අපගේ පසුබැසිම සාධාරණිකරණය කරමින් පසු තැවීමට නොවේ.

අද අපි ඉන්නේ ඔස්ටේලියාවේ අද අපට තිබෙන අභියෝග අපහසුකම් අප ලංකාවේ සිටියානම් අපට තිබෙන්නේ තිබුන ඒවා නොවෙයි. සමහර විට හිතෙනවා මේ අලුත් අභියෝ වලට සුදානම වෙන්න . අපිට කල් ලැබුනා මදදි කියලා. ඒවාට මුහුන දලා ජයගන්න අපිට හුරුවෙන්න බැරිද කියලාත් හිතෙනවා.

කැමරා කාචයක සටහන් වන පින්තූරයකයි. අපේ ඇසේ සටහන් වන පින්තූරයකයි ප්‍රධාන වෙනසක් වෙන්නේ. කැමරා කාචය එයට පෙනෙන එක රාමුවේ ඇති සියු දේ සටහන් කර ගන්නවා. එයට පෙනෙන එපා රාමුවේ ඇති සියුල දේ සටහන් කර ගන්නවා. හැබැයි අපි අවධානය යොමුකරන කොපස සමාධි අපේ ඇසේ සිටහන් වන පින්තූරයෙ රැදෙන්නේ ඒ වටා යෙදෙන අනෙකුත් දේවල් අපේ ඇසෙන් ගන්න රූපයෙ සටහන් වෙන්නේ නෑ. එය අපිට මතක සිටින්නේ නෑ.

ඕනෑම අවස්ථාවක අපි අවධානය යොමුකරන දේ විතරයි. අපේ සිතේ සටහන් වෙන්නේ. ඒ අවධානය යොමුවුන දේ මුල්කරගෙනයි ඒ සම්බන්ධ සිතුවිලි හටගන්නේ. ඔබට පුලුව් ඔබ මෙතෙක් කල් අවධානය යොමු නොකල පැන්තකින් ඔබේ ගැටළුව / අභියෝගය දිහා බලන්න. එහෙම වෙන අංශයකට අවධානය යොමුකිරිමෙන් වෙනත්ම පිලිතුරු ලැබෙන බව සහ මෙතෙක් ඔබේ සැලකිල්ලට භාජනය නොවන්නට වෙන්ත අංග කෙරෙහි හා විකල්ප කෙරෙහි ඔබ යොමුවන බව ඔබට පැහැදිලි වේවි.

ලංකාවේ ඉන්න කොට ඔබව ජයග්‍රහණයක් කරා යොමුකරවපු ඔබේ මෙහෙයුම්කරු ඔබේ සිත (සිතුවිලි නිර්මාණකරු) ඔබ සමගම මෙහි පැමිණි බව අමතක නොකරන්න. ඔබ කොහේහිටියත් ඔබට නියමිත ගමන ඔබ ළගා කරගැනීමට නියමිත ඉලක්ක ලබාගනිමින් යාහැකි වෙනවා ඔබට ඔබ ගැනන විශ්වාස තියෙන තාක්කල්. වෙන කිසිවෙකුටත් වඩා ඔබ ගැන දන්නේ ඔබ නිසා වෙන කවුරු ඔබව නි කලත්වෙන කවුරු ඔබට අතහැරලා දැමුවත් ඔබ ඔබත් සමගම ඉදිරියටම යන්න.



**නුවන් සමරපති**
පුද්ගල සංවර්ධන පුහුණුකරු
කතෘ - U Turn ග්‍රන්ථය
0450 265 167
www.promindsaustralia.com.au

---

12 වන පිටෙන්

අරගලයකින් ඔහු පරාජයට පත්කරන්න පුළුවන් කමක් ලැබෙන්නේ නෑ. එසේ වූවානම් ඔහු පරාජය කරන්න මේ රටේ ජනතාවට ලේ වැගිරීමක් පවා කරන්න සිදුවෙනවා නොඅනුමානයි. නමුත් පසුගිය ජනවාරි 08වෙනිදා මේ රටේ ජනාතවට ඡන්දයකින් රාජපක්ෂ පරාජය කරන්න හැකි වුණා.

**දැන් සමහරු මතයක් හදන්න උත්සාහ කරනවා ජනවාරි 08වෙනිදා කළ වෙනස වැරදීමක් කියලා. සමහරු කියනවා මහින්ද හිටියනම් මීට වඩා හොඳයි කියලා. ඒ අර්ථකතනය කිසිසේත්ම සාධාරණ එකක් නෙවෙයි. කිසිදු සැකයකින් තොරව කියන්න ඕනෑ ජනවාරි 08වෙනිදා කළ වෙනසේ කිසිදු වැරැද්දක් නැහැ.** මේ වෙනසත් එක්ක ජනතාවට විශාල බලාපොරොත්තු, අපේක්ෂා තිබෙන්න ඇති. නමුත් දේශපාලන පක්ෂ විදියට අපිට අවබෝධයක් තිබුණා මේ පාලකයින්ගෙන් ඉටුකරගත හැක්කේ කුමන ප්‍රමාණයක්ද කියලා. අද තිබෙන පාලනය ගොඩ නැගුණේ පාලකයින්ගේ උවමනාවටම නෙවෙයි. ඔවුන්ට තම පාලනය ගෙන යෑමට නොහැකි අර්බුදයක් මතු වූ නිසයි.
මීට පෙර 17 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගැනීමට හැකිවුණේ චන්ද්‍රිකා බණ්ඩාරනායකට තම බලය ආරක්ෂා කරගැනීමට අර්බුදයක් මතුවූ නිසයි. 17වෙනි සංශෝධනය පිළිබඳ සාකච්ඡා කරන වෙලාවේ ඇය කිව්වා මාගේ බලය අඩුකරන්න සාකච්ඡා කරන්න මටම සිදුවුණා කියලා. ඇය කැමැත්තෙන් කළ දෙයක් නෙවෙයි. ඒ වගේම අදත් එවැනි තත්වයක් මතුවෙලා තිබෙනවා. මේ වනවිට රටේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා කේන්ද්‍රය වූ බලයක් නිර්මාණයවී තිබෙනවා. අනෙක් පැත්තෙන් රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා කේන්ද්‍ර කරගත් බලයක් නිර්මාණය වී තිබෙනවා. මේ දෙදෙනා උත්සහ කරගනිමින් ඉන්නවා තමන්ගේ බලය වැඩිකර ගන්නේ කොහොමද කියලා. මේ වටපිටාව තුළ අපිට යම් ඉඩක් විවෘතවී තිබෙනවා යම් යම් ප්‍රතිසංස"කරණ ප්‍රමාණයක් දිනාගන්න. ඒනිසා අප විසින් ඉදිරිපත් කර තිබෙන මෙම කඩිනම් ප්‍රතිසංස්කරණ යෝජනා ඉටුකරගත හැකි යැයි අපිට විශ්වාසයක් තිබෙනවා.

සමහරු කියනවා නපුරු සතෙක් වගේ තිබුණ විධායක ජනාධිපති ක්‍රමය දැන් පූස් පැටියෙක් බවට පත්වෙලා කියලා. එයට හේතුවක් තිබෙනවා. පාර්ලිමේන්තුවේ බලයත් විධායක ජනාධිපති ධුරයත් එක් තැනකට කේන්ද්‍රගත වූවානම් මේ විධායක බලය නපුරු සතෙක්ම තමයි. දැන් එසේ

**ඒ වගේම වංචා දූෂණ විමර්ශනය සඳහා විශේෂ පනතක් ගේන්න කියලා අපි ආණ්ඩුවට බලකරනවා. නැතිනම් අපි විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුගේ යෝජනාවක් විදියට පනතක් ඉදිරිපත් කරනවා. ඒ වගේම විදේශ ගත ශ්‍රී ලාංකිකයින්ගේ ඡන්ද අයිතිය පිළිබඳ කටයුතු කරන්න පාර්ලිමේන්තු කාරක සභාවක් පත්කරන්න කියලා යෝජනාවක් අපිට තියෙනවා.**

නොමැතිවීම නිසා යම් අවස්ථාවක් අපිට ලැබී තිබෙනවා මහජන බලයක් හරහා විධායක ජනාධිපති ධුරය අහෝසි කර ගැනීමේ සටනකට අවතීර්ණ වීමට. මෛත්‍රීපාල ජනාධිපතිවරයා නැවත ජනාධිපතිවරණයට ඉදිරිපත් නොවෙනවා කීවට ඔහු අගමැති ධුරයට තරග නොවදින බවට ප්‍රකාශයක් කර නැහැ. ඔහුත් ජනාධිපති ධුරය අහෝසි කරලා නැවත අගමැති ධුරය ලබාගැනීමට අපේක්ෂාවෙන් ඉන්නවා වෙන්නත් පුළුවන්.

අනෙක් පැත්තෙන් අපිට පේන දෙයක් තමයි ජනමතය කනපිට හැරිලා තිබෙනවා කියන කාරණය. අමාත්‍ය මණ්ඩලය පත්කිරීම ගත්තාම ඒ බව පේනවා. විවිධ ජනකොටස්වල විරෝධයක් එල්ලවූ, මැතිවරණයෙන් පරාජයට පත්වූ එස්.බී. නැවත මේ කැබිනට් මණ්ඩලයේ ඉන්නවා. විවිධ දූෂණ චෝදනා එල්ල වෙලා මහා පරිමාණ වංචා දූෂණ කොට්ඨාශය මගින් පරීක්ෂණ ආරම්භ කොට තිබෙන සුසිල් ප්‍රේමජයන්ත, අනුර ප්‍රියදර්ශන යාපා, ඩිලාන් පෙරේරා වගේ අයත් මේ අමාත්‍ය මණ්ඩලයේ ඉන්නවා. ඒ විතරක් නෙවෙයි අගමැතිවරයාගේ ප්‍රධානත්වයෙන් කැඳවන වංචා දූෂණ විමර්ශන කමිටුවේ නීති උපදේශකයා වශයෙන් කටයුතු කරන තිලක් මාරපන ඇමැතිවරයා ඇවන්ගාඩ් නඩුව භාරගන්නවා. වංචා දූෂණ කමිටුවේදී පීපල්ස් ලීසිං සමාගමේ මූල්‍ය ගණුදෙනුව පිළිබඳව සාකච්ඡා කළාම එම කමිටුවේ නීති උපදේශක ගිහින් ආයතනයෙන් නඩුව භාරගන්නවා. ඒ නිසා මේ අය දූෂිතයින්ට දඬුවම් දෙයි කියලා විශ්වාස කරන්න පුළුවන්ද?

නමුත් එහෙම කියලා අපි බලාගෙන ඉන්න ඕනැද? නැහැ ජනතාව විදියට අපි ආණ්ඩුවට බලපෑමක් කළ යුතුයි. මහා පරිමාණ වංචා දූෂණ විමර්ශන කොට්ඨාශයේ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ දුරකතන බිල පරීක්ෂා කර බැලුවොත් කොයි කාටත් තේරෙන්න පුළුවන් කොයිතරම් දුරකතන ඇමතුම්වලින් බලපෑම් ඇවිත් තිබෙනවද කියලා. එම දේශපාලන බලපෑම් වැළැක්වීම සඳහා අපි මැදිහත් විය යුතුයි.

19වෙනි සංශෝධනයට අපි යෝජනාවක් දැම්මා ඇමති ධුර 30යි නියෝජ්‍ය ඇමති දුර 30යි කියලා. නමුත් අපිට ඒක සම්මත කරගන්න බැරිවුණා. අන්තිමට සම්මත වුණේ ඇමැති ධුර 30යි නියෝජ්‍ය සහ රාජ්‍ය ඇමැති ධුර 40ක් කියලා. රාජ්‍ය ඇමැති ධුර කියලා තනතුරක් මොකටද? අමාත්‍යංශ විෂය පථයන් විද්‍යානුකූලව වෙන්කළ යුතුයි. ව්‍යඹ සංවර්ධන ඇමැතිට සංස්කෘතික ක්ෂේත්‍රයත් බාරදීලා. ආගමන විගමන දෙපාර්තමේන්තුවත් බාරදීලා. වයඹ සංවර්ධනයයි සංස්කෘතියයි, ආගමන විගමන දෙපාර්තමේන්තුවයි කොහොමද එක ඇමැති කෙනෙක් කරන්නේ.

ඒ විතරක්ද අධ්‍යාපන ඇමැතිට කොහොමද මහාමාර්ග විෂයපථය පවරන්නේ. ඒ නිසා අපි ආණ්ඩුවට බලපෑම් කරනවා අමාත්‍යංශ විෂය පථයන් බෙදීම සඳහා පනතක් පාර්ලිමේන්තුවට ගෙන්න කියලා. ආණ්ඩුව ගේන්නේ නැතිනම් අපි පනතක් පාර්ලිමේන්තුවට ගේනවා. ඒ වගේම වංචා දූෂණ විමර්ශනය සඳහා විශේෂ පනතක් ගේන්න කියලා අපි ආණ්ඩුවට බලකරනවා. නැතිනම් අපි විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුගේ යෝජනාවක් විදියට පනතක් ඉදිරිපත් කරනවා. ඒ වගේම විදේශ ගත ශ්‍රී ලාංකිකයින්ගේ ඡන්ද අයිතිය පිළිබඳ කටයුතු කරන්න පාර්ලිමේන්තු කාරක සභාවක් පත්කරන්න කියලා යෝජනාවක් අපිට තියෙනවා.

අපේ අරමුණ වුණේ මේ ආණ්ඩුවෙන් කරගත හැකිව තිබෙන කඩිනම් යෝජනා ප්‍රමාණයක් ඉදිරිපත් කොට ඒවා ඉටුකරවා ගැනීමයි. නමුත් ඊට එහාට ගොස් මේ ආණ්ඩුවේ ආර්ථික ප්‍රතිපත්ති ගැන සංවාදයක් ගොඩ නැගිය යුතුව තිබෙනවා. මොකද මේ ආණ්ඩුව අමාත්‍යංශ වෙන්කරලා තිබෙන ආකාරයෙන් අපිට පේනවා මේ රටේ ගොවියගේ, ධීවරයගේ කුඩා පරිමාණ කර්මාන්තකරුවාගේ ආර්ථිකය පිළිබඳව කිසිදු සැලකිල්ලක් දක්වා නැහැ කියලා. උතුරේ දේශපාලන ප්‍රශ්නය ගත්තත් ඒ වගේ. උතුරේ දේශපාලනය කේන්ද්‍ර කර ගත් දේශපාලන සංවාදයක් ගොඩ නැගිය යුතුව තිබෙනවා. නමුත් ඒවා තිබෙන්නේ වෙනස් දේශපාලන තලයක.
මේ සඳහා පුළුල් මහජන ව්‍යාපාරයක් ගොඩ නැගිය යුතුව තිබෙනවා. මොකද මේ යෝජනා මාලාව පාර්ලිමේන්තු ක්‍රියාවලියක් සමග ගැට ගැසී තිබෙනවා. ඒ වගේම මේ යෝජනා මාලාව රටේ ජනතාවගේ ජනජීවිතය සමග ගැටගැසී තිබෙනවා. ඒ නිසා මේවා ඉටුකරවා ගත හැකියි කියන දැඩි විශ්වාසයක් අපිට තිබෙනවා.